**UNIVERSITY OF PERADENIYA**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**தொடர் தொலைக்கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - පැරණි නිර්දේශය) පරීක්ෂණය - 2020**
**பொதுக்கலைத் தேர்வு (வெளிவாரி – பழைய பாடத்திட்டம்) - 2020**
**Bachelor of Arts (External - Old Syllabus) Examination - 2020**

**SINHALA I (SLG I)**
**(ප්‍රබන්ධ කථා හා නාට්‍ය කලාව)**

**කාලය පැය (03) තුනයි**

**සැම කොටසකින් ම එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.**
**මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව නවයකි (09).**

---

## I කොටස

01. නවකතාව යනු ජීවිත විවරණයකි.'' මෙම අදහස සිංහල නවකතාව ආශ්‍රයෙන් සනිදර්ශන ව විවරණය කරන්න.

02. පිරිමි සිතක යථාරූපී භාවය, විරාගයෙහි එන අරවින්දගේ චරිතයෙන් හෙළි වන්නේදැ'යි පැහැදිලි කරන්න.

03. ''සාහිත්‍යය සහ සත්‍ය ජීවිතය අතර මහත් පරතරයක් ඇත.'' මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස එමා බෝවාරී නවකතාව ඇසුරින් සමර්ථනය කරන්න.

## II කොටස

04. කෙටිකතාවෙහි අන්තර්ගත මූලික ලක්ෂණ පිළිබඳ ප්‍රාමාණික විවරණයක් සපයන්න.

05. සරල සිද්ධියක් ඇසුරෙන් සමාජය හා ජීවිතය පිළිබඳ පුළුල් විවරණයක් කිරීමට කෙටිකතාකරුවා සතු කුසලතාව ජීවන සුවඳ කෙටිකතා සංග්‍රහයෙහි එන නිර්මාණ මගින් පෙන්වා දෙන්න.

06. ''මිනිස් සිතුවිලි සියුම් ව නිරූපණය කිරීමට කෙටිකතාව සමත්ය.'' මෙම අදහස කවබත යශුනරිගේ කෙටිකතා ඇසුරින් පැහැදිලි කරන්න.

## III කොටස

07. ''ගැටුමක් නැති තැන නාට්‍යයක්ද නැත.'' මෙම ප්‍රකාශය සෙල්ලම් ගෙය හෝ මැටිකරත්තය හෝ ඇසුරෙන් සනිදර්ශන ව විවරණය කරන්න.

08. නාට්‍ය ශාස්ත්‍රයෙහි දැක්වෙන 'ලෝක ධර්මී' සහ 'නාට්‍ය ධර්මී' යන සංකල්ප පිළිබඳ ප්‍රමාණික විස්තරයක් සපයන්න.

09. ''පෙමතො ජායතී සොකො'' නාට්‍යය, හුදු යතිවර දැක්ම ඉක්මවා, ගැඹුරු බෞද්ධ දාර්ශනික පදනම ස්පර්ශ කරයි.'' මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස සාධක සහිත ව ඉදිරිපත් කරන්න.

(සැම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගිනි).

UNIVERSITY OF PERADENIYA
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
தொடர் தொலைக்கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்

ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - පැරණි නිර්දේශය) පරීක්ෂණය - 2020
பொதுக்கலைத் தேர்வு (வெளிவாரி - பழைய பாடத்திட்டம்) - 2020
Bachelor of Arts (External - Old Syllabus) Examination - 2020

# SINHALA II (SLG II)

(පැරණි ගද්‍ය සාහිත්‍යය, භාෂාව හා ව්‍යාකරණය)

කාලය පැය (03) තුනයි

පළමු වන හා නවවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.
II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගත යුතුය.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව නවයකි (09).

---

## I කොටස

01. (අ). (i). පහත දැක්වෙන පාඨ තුන ලිහිල් බසින් ලියන්න.

(ලකුණු 10 + 8 + 7 = 25)

(ආ). (i). ඉරි ඇඳි පද අතුරින් පහකට විවරණ සපයන්න.

(ලකුණු 3 x 5 + 7 = 15)

රජ බුදුපාමොක් සඟහට[3] දන් දී "වහන්සෙ, මම තුලු වැඩනා විනා වාස[4] කරන්නට නොහැක්කෙමි. වෙලෙ වුව, මැනැ මැ යැ; නොවෙලෙ වුව, මැනැ මැ යැ; බුදුන් කරා එළඹෙමි[5]. යට්ඨිවන උයන් ඉතා[6] දුර; මෙ මා ගෙ වෙළුවන උයන් නොදුරු[7] නො ද ආසන්න යැ; යන එන කලට සුව යැ; බුදුනට නිසි සෙනසුනැ. මා ගෙ මෙ උයන් පිළිගන්නෙ මැනැවැ"යි රන්කොතුරුයෙන් මිණිපළ ගඳින් වැසුණු මිණි වන් පහන් දිය ගෙනැ වෙළුවන උයන් දෙනුයෙ. බුදුන් අතැ දිය ඔත. බුදුන් උයන් පිළිගත් විගසැ "බුද්ධස්සනෙ මූල ඡාතැ" යි මහ පොළො ගුගුළෙ. දඹදිව තෙලෙහි වෙළුවන උයන් තබා, පොළො ගුගුරුවා ගත් අනෙක් වෙහෙරෙක් නැති. ලක්දිවැ මහාවිහෙර තබා පොළො ගුගුරුවා ගත් අනෙක් වෙහෙරෙක් නැති. බුදුහු වෙළුවන උයන් පිළිගෙනැ රජ හට අනුමෙවෙනි[8] කොටැ හුනස්නෙන් නැඟී සඟුන් පිරිවරා වෙළුවන උයන් වැඩීයෙ. එ කල්හි සැරියුත් මුගලන්[9] දෙදෙන දෙසිය පනස් දෙනාකු[10] ගෙනැ බුදුන් කරා එළඹැ එහිභික්ඛුභාවයෙන් පැවිජි වැ සහපිරිවරින් රහත් වැ අගසවු තන් පත් වූහු.

(අමාවතුර, කෝදාගොඩ ඤාණාලෝක හිමි සංස්, 39පි).

(ii).

ඒ කල යශොධරා දේවී "මා තපසට යා නො දෙන පසු උන් වහන්සේ මහණ ධම් පිරිමෙන් විඳිනා යම් ම දුකෙක් ඇත් නමුත් මම මේ රජගෙයි දී ම දුක් විඳ, ඔබට ම පක්ෂපාත කම් කෙරෙමි" යි සිතා මිනිසුන් යවා බුදුන් දවස් යවන ලෙස් නියම දන්නාහු ඔබ ඉසකේ කැපූ බවු, මහණ වූ බවු, පිඬු සිඟා ජීවත් වන ලෙස්, මත්තිකා භාජනයෙන් අනුභව කරන ලෙස්, එක් වේලේ වළඳන ලෙස්, උසසුන් මහඅස්නේ නො සැතපෙන ලෙස්, අසා උපන් මහත් වූ කම්පා ඇති ව "එක රජගෙයි බොහෝ දවසක් ශ්‍රීසම්පත් විඳ උන් වහන්සේ ඒ හැර දූන් මේ යා දුකක් විඳිනේ මතු වන වැඩක් උදෙසා ම ය, ඔබට මතු වන වැඩක් මට ද වී නම් යෙහෙකැ යි කියා තුමු ද කෙස් වැටිය කපා හැර කාෂාවස්ත්‍ර ධරා, මැටි පාත්‍රයෙන් කා එක්වේලේ සයින් හෙව උසසුන් මහ අස්නේ නො සැතපී නීචාසනවල ම සැතපී, බුදුන් දක්නා සත් අවුරුද්ද මුළුල්ලෙහි, තුමූ ද නො එක් ව්‍යසන, ගෙන, ඔබට අනු වූ ගුණයෙන් ප්‍රතිපත්ති පූජා කළහ. පසු ව බුදුන් ලොවුතුරා බුදු ව, යට කී ක්‍රමයෙන් පළමු වන ගමනෙහි බන්ධු සංග්‍රහ නිසා කිඹුල්වත් නුවර වැඩි දෙවන දවස් වළඳා අන්තයෙහි තමන්ගේ රජගෙට වැඩ තමන් ඔබගේ ශ්‍රීපාද ගොප්මස දක්වා අල්වා මහ හඬින් හඬා එකත් පස් ව හුන් වේලෙහි පිය මහරජ්ජුරුවන්ට උපන් සැක හා තමන්ට උපන් භය සන්හිඳුවනු සඳහා චන්දකින්නර ජාතකයෙන් බණ වදරා:

(පූජාවලිය, කිරිඇල්ලේ ඤාණවිමල හිමි සංස්, 677පි).

(iii).

එකල සාමණේරයන් වහන්සේ ද රජ්ජුරුවන් අතට පාත්‍රය දී එම රජ්ජුරුවන් ගේ අත එල්බ ගෙන සිංහාසනයට නැගී වැඩහුන් සේක. රජ්ජුරුවෝ තමන්ට පිළියෙළ කොට තිබූ සියලුම කැඳ අවුලුපත් බත් විකෘති ආදිය එලවූහ. සාමණේරයන් වහන්සේ එයින් තමන් වහන්සේ යැපෙන පමණක් ම පිළිගත් සේක. මෙසේ වළඳවා ඉක්බිති රජ්ජුරුවෝ කියන්නාහු "පුතණුවන් වහන්ස, නුඹ වහන්සේ බුදුන් වදාළ අවවාද ධර්මය දන්නා සේක්ද" යි විචාළහ. සාමණේරයන් වහන්සේ එසේය "මහරජ, අප අලුත මහණ වූ හෙයින් විස්තර වශයෙන් කියාලන්ට නොපිළිවන. එතකුදු වුවත් එක දෙශ මාත්‍රයක් දනුම්හ" යි වදාළ සේක. එකල රජ්ජුරුවෝ "එසේ වී නම් පුතණුවන් වහන්ස, අපටත් ඒ අවවාද ධර්මය වදාළ මැනවැ" යි කීහ. සාමණේරයන් වහන්සේ ද "යහපතැ" යි වදුරා ඒ රජ්ජුරුවන් තමන් හා එක පියන්ට ද නවාතුවක් මල්බෑ රජකුමරුවන් මරවාපි හෙයින් මෙ රජ ඉතා වණ්ණ පරුෂය, කුසල් කිරීමෙහි ප්‍රමාද යයි සිතා රජ්ජුරුවන්ට සුදුසු ලෙස ධර්මපදයෙහි අප්‍රමාද වර්ගයෙන් අනුමෙවෙනි බණ වදාළ සේක. රජ්ජුරුවෝ එනාහි "අප්පමාදො අමතපදං පමාදො මච්චුනො පදං" යන මේ පදමය පමණක්ම අසා ස්වාමීනි, පුතණුවන් වහන්ස, සියලු ධර්මයන්ම මෙ පමණකින් දැන පිමි, බොහෝ කොට බණ කියා වෙහෙස නොවිඳ සමාප්ත කළ මැනවැ" යි කීහ.

(සද්ධර්මාලංකාරය, කිරිඇල්ලේ ඤාණවිමල සංස්, 338පි).

## II කොටස

02. අමාවතුරේ අන්තර්ගත වන්නේ බුද්ධිගෝචර රීතියකැ'යි වියතුන් පවසන්නේ කවර හේතු නිසාදැ'යි පහදන්න.

03. සිද්ධි, අවස්ථා හා චරිත නිරූපණයෙහි ලා ගුරුළුගෝමීන්ගේ සාමර්ථ්‍යය පිළිබඳ ඇගයීමක යෙදෙන්න.

04. "පූජාවලිය භක්ති කාව්‍යයක් වශයෙන් පමණක් නොව ඓතිහාසික ග්‍රන්ථයක් වශයෙන්ද අගය කළ හැකිය." පක්ෂ ව හෝ විපක්ෂ ව හෝ කරුණු දක්වන්න.

05. "සද්ධර්මාලංකාරය ශ්‍රද්ධාව හා භක්තිය වඩවන ධර්ම ග්‍රන්ථයකි." උක්ත ප්‍රකාශය පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

## III කොටස

06. සිදත් සඟරාවේ අන්තර්ගත විසිවැදෑරුම් වියරණ විධි පිළිබඳ විමර්ශනයක් කරන්න.

07. සිදත් සඟරාවේ අක්ෂර මාලාව පිළිබඳ ව පවත්නා ප්‍රතිවිරෝධී අදහස් සමාලෝචනය කරන්න.

08. සිදත් සඟරාවේ අන්තර්ගත පහත දැක්වෙන වියරණාංගවලින් 3කට විවරණ සපයන්න.

1. සත්
2. ලිඟු
3. විබත්
4. සමස්
5. හකර විනිස

09. පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කර ලියන්න.

1. ඇමතිවරයා විසින් මැරයෝ ලවා මිනිසුන් මරවනු ලැබෙති.
2. තාත්තා ද තෝ ද එහි යති.
3. කරත්තය ද ගොවියා ද පොළට යයි.
4. අපි හෝ ඔහු හෝ මහනුවර යමු.
5. අපි දැනට එම නිවසෙහි නැත.
6. ඔවුහු එහි යතත් අප නො යමු.
7. ඇමතිවරු පවසන දෑ බොරු නො වෙති.
8. පියකු බඳු ගුරුතුමා දිළිඳු සිසුහු රැක බලා ගත්තෝය.
9. අයෙක් සුරාමතින් නටයි.
10. නාහිමිපාණෝ දහම් දෙසුවේය.

(2 සිට 9 දක්වා පිළිතුරුවලට උපරිමය ලකුණු 15 බැගිනි).

**UNIVERSITY OF PERADENIYA**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**தொடர் தொலைக்கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - පැරණි නිර්දේශය) පරීක්ෂණය - 2020**
**பொதுக்கலைத் தேர்வு (வெளிவாரி – பழைய பாடத்திட்டம்) - 2020**
**Bachelor of Arts (External - Old Syllabus) Examination - 2020**

**SINHALA III (SLG 3)**
**(කාව්‍ය විචාරය, පැරණි පද්‍ය සාහිත්‍යය හා සාහිත්‍ය වංශය)**

**කාලය පැය (03) තුනයි**

**පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**
**II, III කොටස්වලින් එක් ප්‍රශ්නයක්වත් තෝරාගත යුතුය.**

**නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.**
**මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08).**

---

## I කොටස

01\. (අ). (i). පහත දැක්වෙන පද්‍ය ලිහිල් බසින් ලියන්න.

නොපලහති ම මන නුරාබිඳු වුන්වන්නෝ
විසිතුරු සකර බිම්හී සුහුඹුල් දුටු විරූ තුරු

නොදැවූ හළ වැඩූ හරා පලඟ රිටුමුළු
මුවරදදා ඉඳු සමත් වන්නට සතුරු ලෙව් මෙවු

පියවත් පහස් ගඳ රස රූ සදත් නොතිබී
යහදසනැය තිය තමා තබා ගිය වන් එ නුවර

ම සඳහතින් ඔවුන් නොමින් මෙසි වඩන්නේ
අහෝ නොමද ල තමා විසිනා නොදන්නෙන් මුන්

තුනුහෙම්ලිය වතළ මෙනෙ සෝකිණු කෙසේ වී
සැරහූ තෙනෙබරණ හෙම් කිණු මුත් නැත් කනාවන්

(**කව්සිළුමිණ** : ඇම්.බී. ආරියපාල සංස්කරණය, 567-571 ගී)

(ii). යමක් රසවත් ව නිරූපණය කිරීමට **කව්සිළුමිණ** කවියා දක්වන සාමර්ථ්‍යය පිළිබඳ කෙටිසටහනක් ලියන්න.

(ආ). (i). පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

උ සේ සරන නුබසර යුවල නුබ කු සේ
තොසේ බලා පුර සිරි වන් රුවන් ය සේ
මෙසේ විමන් සසගින් කොතැනකර සි සේ
කෙසේ ගෙනවූදෝ සැක නොකරනුය කෙ සේ

එපුර වරේ වරඟන වේ මඟ තස          රා
සරන වරේ පිළිබිඹු වෙසෙහි තොරතු          රා
නොදැන තරේ පිළිමිණි බිතට පැන්සැ          රා
අතර තුරේ විද රැවටෙනුය පන්සැ          රා

(මයූර සන්දේශය. ඩබ්.එෆ්. ගුණවර්ධන සංස්කරණය, 55-56 පද්‍ය)

(ii). "මයූර සන්දේශය පරිකල්පන ගුණයෙන් අනූන වර්ණනාවන්ගෙන් පිරුණකි." මෙම අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

(ඇ). (i). පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

කුල දෙටුවන්          පැවති
සෙබෙහි තෙද ණින් නො          දිලෙති
වෙන් වූ සඳ          දිලෙති
රසින් මුසු නුමුසු රන් සේ          වෙති

නො වළා වරද          තැන්
නො නැමී බසට මහ          තන්
විලසින් සිය          සුතන්
සතන් රකිනු ය බලා ඇම          තැන්

නො මකා කුල          සිරිත්
නො තබා ම දෙන දන්          වත්
නො වඩා අය          බදුත්
නැඟු සිත් සේ ම දිය          දියකොත්

ගත උන්          සබාමය
බස උන් ගේ          සබාමය
ඉසුරෙන්          සබාමය
සබා නම් උන් උන්          සබාමය

අවා බිය          ඇවුරු
සිත් සත් ගුණෙන්          සපිරු
දිගු බිත          කිවියුරු
ඔවුන් ගුණ සිතුයමින්          තැවුරු

(බුදු ගුණ අලංකාරය : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 39-43 පද්‍ය)

(ii). බුදුගුණාලංකාර කතුවරයා දක්වන රජ සිරිත් වර්තමාන සමාජයට අදාළ කරගත හැකිදැ'යි සමාලෝචනය කරන්න.

(පළමු වන ප්‍රශ්නයට උපරිමය ලකුණු 40යි).

## II කොටස

02. සියබස්ලකර කතුවරයා දක්වන මහා කාව්‍ය ලක්ෂණ පිළිබඳ විචාරාත්මක විවරණයක් සපයන්න.

03. ''භරත මුනිවරයා විසින් ඉදිරිපත් කරන ලද රස සංකල්පය නූතන කාව්‍ය විචාරයෙහි ලා ද ප්‍රාමාණික ය.'' මෙම අදහස සනිදර්ශන ව පැහැදිලි කරන්න.

04.- වක්‍රෝක්තියෙහි පදනම කාව්‍යාර්ථය නොව, කාව්‍ය අර්ථ ප්‍රකාශන විලාසය යි.'' මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස දක්වන්න.

## III කොටස

05. ''ආගමික කතා පුවතක් රසවත් කාව්‍යානුභූතියක් බවට පත් කරන ආකාරය කව්සිළුමිණිකරුවා මැනවින් දැන සිටියේය.'' මෙම කියමන සමර්ථනය කරන්න.

06. අවස්ථෝචිත ලෙස කාව්‍ය ආකෘතිය යොදා ගැනීමෙන් මයූර සන්දේශ රචකයා සිය කාව්‍යය ආකර්ෂණීය රචනයක් බවට පත් කරන ආකාරය අදාළ නිදසුන් ඇසුරෙන් විවරණය කරන්න.

07. ''බුදුගුණාලංකාරය හින්දු දේවවාදයට එරෙහි ව රචනා වූ අපූරු බුදු ගුණ වැනුමකි.'' මෙම ප්‍රකාශය සනිදර්ශන ව පහදන්න.

08. සිංහල කාව්‍යයෙහි විද්‍යමාන ජන කාව්‍ය ලක්ෂණ පිළිබඳ විවරණයක් කෝට්ටේ හා සීතාවක යුගවල රසික පද්‍ය කෘති විශේෂයෙන් ඇසුරු කරමින් ඉදිරිපත් කරන්න.

(2 සිට 8 දක්වා පිළිතුරුවලට උපරිමය ලකුණු 20 බැගිනි).